**කොළඹ විශ්වවිද්‍යාලය**

**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී විශේෂ උපාධි සිව්වන වසර පරීක්ෂණය**

**පළමු සෙමෙස්තරය - 2019/2020**

# BST 4179 – පර්යේෂණ ක්‍රමවිද්‍යාව

(පැ දෙකයි)

ප්‍රශ්න <u>**තුනකට**</u> **(03) පමණක්** පිළිතුරු සපයන්න.

---

1. ගුණාත්මක සහ ප්‍රමාණාත්මක දත්ත මොනවාදැයි පැහැදිලි කරමින් බෞද්ධ අධ්‍යයන පර්යේෂණ විෂයයෙහි ගුණාත්මක දත්ත භාවිතයේ වැදගත්කම පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

2. සාහිත්‍ය විමර්ශනය යනු කුමක්දැයි හඳුන්වා සාර්ථක පර්යේෂණ ක්‍රියාවලියකට එහි ඇති උපයෝගීතාව පරීක්ෂා කරන්න.

3. සාරසංක්ෂේප (Abstract) රචනයේ වැදගත්කම සහ එහි ඇතුළත් විය යුතු අත්‍යවශ්‍ය අංග පැහැදිලි කොට ඔබ දැනට තෝරා ගෙන ඇති නිබන්ධ මාතෘකාවට අදාළව වචන තුන්සියයකට නොඅඩු සාරසංක්ෂේපයක් ලියන්න.

4. ශාස්ත්‍රීය පර්යේෂණ විෂයයෙහි භාෂාවේ කාර්යභාර්ය පැහැදිලි කරමින් සිංහල භාෂා භාවිතය හා බැඳුණු ඔබ හඳුනාගත් දුර්වලතා විභාග කරන්න.

5. “පර්යේෂණ සැලැස්ම වනාහි පර්යේෂණය පිළිබඳ මාර්ග දර්ශකය යි”. එහි ඇතුළත් විය යුතු මූලික අංග විෂයයෙහි අවධානය යොමු කරමින් සාකච්ඡා කරන්න.

6. පහත සඳහන් මාතෘකා අතරින් <u>**දෙකකට**</u> ප්‍රමාණවත් සටහන් ලියන්න.

    i. පර්යේෂණ ගැටලුව
    ii. පාදක සටහන් යෙදීම
    iii. පර්යේෂණ ක්‍රම
    iv. විෂය සූචිය

*******************